# වෙසක් පද්‍යය
රවීන්ද්‍රනාත් තාගෝර්



## බුදුන් වහන්සේට

වෛරයේ උන්මාදයෙන්
වියරු ය අද ලෝකය,
රුදුරු ය එහි ගැටුම්
නැත නිමා වන සෙයක්

ඇද ය එහි මංමාවත්
වියවුල් ය එහි තණ්හා ජාලා

තියුණු වේදනාවකින් හඬති සියලු සත්තු
ඔබගේ පහළ වීමක් පතා

අහා අපරිමිත ජීවිතය ඇත්තාණෙනි
මුදවා ලන්න ඔවුන්,
නඟන්න බලාපොරොත්තුවේ
ඔබේ සනාතන හඬ,

ක්ෂය නොවන මකරන්ද නිධානය
ගැබ් වූ ස්නේහයේ පද්මය
ඔබගේ ආලෝක ධාරාවෙන්
විකසිත වීමට ඉඩ හරින්න,

අහා ශාන්ති නායකයාණෙනි
විමුක්ති දායකයාණෙනි
ඔබගේ අපරිමිත කරුණාවෙන් හා යහපතින්
පිසදා හරිනු මැන
සියලු කෙලෙස් මල
මිහි තලයේ හදවතින් ම

අහා අමර තිලිණ දායකයාණෙනි
කැපවීමේ බලය දෙනු මැනවි අපට,
ගනු මැන අපගෙන් අපගේ තණ්හාවන්
මමත්වයේ අහංකාරය,

ප්‍රඥාවේ නවෝදයක විභූෂිතයෙන්
අඳ බාලයන්ට ලොව දැක්මට ඉඩ හරින්න,
මිය ගිය ආත්මයන්ට නව පණ ලබන්නට ඉඩ හරින්න
අහා ශාන්ති නායකයාණෙනි
විමුක්ති දායකයාණෙනි
ඔබගේ අපරිමිත කරුණාවෙන් හා යහපතින්
පිසදා හරිනු මැන
සියලු කෙලෙස් මල
මිහි තලයේ හදවතින් ම

1934 මැයි මස වෙසක් උත්සවය නිමිත්තෙන් ශ්‍රී ලංකාවට පැමිණි රවීන්ද්‍රනාත් තාගෝරයන් විසින් මෙම පද්‍යය ප්‍රබන්ධ කරන ලද අතර, එය ප්‍රථමයෙන් ප්‍රකාශයට පත් කෙරුණේ 1934 මැයි මස 28 වන දින 'සිලෝන් ඩේලි නිවුස්' පුවත් පතෙහිය.

( පද්‍යයේ සිංහල පරිවර්තනය ෘ කුසුම් දිසානායක )